# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## පළමු වාරය - ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

| 7 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය | කාලය : පැය 1 |
|---|---|---|

## 7.1 අපේ පවුල

**පහත සඳහන් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) ජන සමාජයේ කුඩාම ඒකකය වන්නේ

i) පාසල
ii) පන්සල
iii) නගරය
iv) පවුල

(2) ඔබගේ උසස් ගතිගුණ හැසිරීම් රටා, සුවිශේෂී හැකියාවන් පිළිබඳ ඇතිකරගන්නා අභිමානය

i) අනන්‍යතාවයයි
ii) ආඩම්බරකමයි
iii) අරමුණයි
iv) ආත්මාභිමානයයි

(3) නිවැරදි ජීවන අරමුණු කරා ලඟා වීමට අවශ්‍ය සාධක නොවන්නේ

i) අරමුණ වෙනුවෙන් කැපවීම
ii) සැලසුම් සහගත බව
iii) උචිත දේ තෝරා ගැනීම
iv) මුදල් අරමුණ ඉටු කරගැනීම

(4) පුද්ගලයෙකු සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල යෙදීම නිසා අත්වන ප්‍රයෝජනයකි.

i) විධාන පිළිපැදීම
ii) නීතිගරුක වීම
iii) චිත්තවේග සංයමයෙන් යුතුව ප්‍රකාශ කිරීමේ හැකියාව වර්ධනය
iv) කණ්ඩායම් හැඟීම

(5) සොඳුරු ගුණ නුවණ යුතු උතුමෝ පතර
නපුරු දුදන සහ එක්වුව වෙති අසර
මෙම කවිය සඳහන් වනුයේ

i) සුභාෂිතය
ii) ලෝවැඩ සඟරාව
iii) සිරිත් මල්දම
iv) කව්සිළුමිණ

(6) පාසල් ශිෂ්‍යයකු වශයෙන් විභාගය හොඳට සමත් වීම ඔබේ ජීවන අරමුණක් නම් මෙම අරමුණ ජයගැනීමට,

i) අරමුණ සිත තුල තිබීම ප්‍රමාණවත්ය
ii) ගුරුවරයා කියන දේ පමනක් කළ යුතුය
iii)දෙමාපිය උපදෙස් පිළිපැදිය යුතුය
iv) අරමුණ ඉටු කරගැනීමට සැලසුම් කර ක්‍රියාත්මක විය යුතුය

(7) ජීව විද්‍යාත්මකව පුද්ගලයකුගේ අනන්‍යතාව හඳුනා ගනු ලබන්නේ

i) නහයේ හැඩයෙනි
ii) අත්ලේ සලකුණු මගිනි
iii) බාහිර පෙනුමෙනි
iv) DNA ව්‍යුහය පිළිබඳ පරීක්ෂණය මගිනි

(8) සමාජයේ යහපතට හේතුවන ආයතනයකි
i) වනජීවී දෙපාර්තමේන්තුව
ii) කාලගුණ දෙපාර්තමේන්තුව
iii) රෝහල
iv) පුස්තකාලය

(9) පාරිභෝගිකයකු වශයෙන් අඩුම මිලට ගුණාත්මක භාවයෙන් උසස් භාණ්ඩ මිල දී ගැනීමට නම් ඔබ තුල තිබිය යුත්තේ
i) භාණ්ඩවල හිඟතාවය පිලිබඳ දැනුමය
ii) අපේක්ෂා කරන භාණ්ඩවල මිල ගණන් පිලිබඳ අවබෝධයයි
iii) සැපයුම පිලිබඳ අවබෝධයයි
iv) භාණ්ඩවල ඉල්ලුමෙහි ප්‍රමාණය පිලිබඳ අවබෝධයයි

(10) ඔබගේ මවගේ අයියාගේ බිරිඳ ඔබේ
i) ලොකු අම්මා
ii) පුංචි අම්මා
iii) නැන්දා
iv)ලොකු ආච්චී

**පහත ප්‍රශ්නවලට පිලිතුරු සපයන්න.**

(1) i) පවුලේ සාමාජිකයෙකු ලෙස ඔබ තුල වර්ධනය කරගත යුතු ගුණාංග හතරක් සඳහන් කරන්න.
ii) පවුල තුල දක්නට ලැබෙන පොදු ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
iii) පවුලේ සාමාජිකයකු ලෙස ජීවත්වීම නිසා ඔබට ලැබෙන ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.

(2) i) ඔබේ ජීවිතයේ සාර්ථකත්වයට බලපාන හිතකර බලවේග හතරක් නම් කරන්න.
ii) යහපත් ගතිගුණ ඔබ තුල වර්ධනය කිරීම සඳහා පාසලේ ක්‍රියාත්මක වන වැඩසටහන් දෙකක් නම් කරන්න.
iii) ඔබ ඉතා සමීපව ඇසුරු කරන කලණ මිතුරකු තුළ දක්නට ලැබෙන යහපත් ගුණාංග කීපයක් ලියන්න.

(3) දෙගුරුන් ගුරුන් දුටුදෙවියන් ලෙස සිතමු
උතුමන් බසින් ඉටු දෙවියන් දැන ගනිමු
.....................................................................
.....................................................................
i) මෙම කවිය සම්පූර්ණ කරන්න.
ii) ඔබ විවේකය ඵලදායීව ගත කරන අවස්ථා දෙකක් නම් කරන්න.
iii) සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් තුනක් නම් කරන්න.

(4) i) වර්තමානයේ පවුල් ඒකකවල සාමාජිකයින්ට මුහුණ පෑමට සිදුවන අභියෝග දෙකක් නම් කරන්න.
ii) අයහපත් චිත්තවේග තත්වයන් පාලනය කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග තුනක් සඳහන් කරන්න.
iii) පුද්ගලයා තුල ඇතිවිය හැකි අයහපත් චිත්තවේග දෙකක් සඳහන් කරන්න.

(5) i) වැඩ ලෝකය යනු කුමක්ද?
ii) රැකියාවක යෙදීමෙන් ප්‍රමාණවත් ආදායමක් ලැබීම නිසා අත්වන ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.
iii) පවුලෙන් ඔබට ලැබෙන අයිතිවාසිකම් දෙකක් සඳහන් කරන්න.

සැකසුම - කල්‍යාණි රත්නායක මිය